**සංවර්ධන ලොතරැයි මණ්ඩලය - 2015**

**--------------------------------------------**

සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ 2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිළි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1997 අංක 20 දරන සංවර්ධන ලොතරැයි මණ්ඩල පනතේ 14(3) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර මණ්ඩලයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

**----------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

**---------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාලවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම් වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් මණ්ඩලයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උප වගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

**--------------------------------------------**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

------------------

### 2.1 තත්ත්වාගණනය කළ මතය

------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2015 දෙසැම්බර් 31 දිනට සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

--------------------------------------

#### 2.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති

------------------------------

පහත සඳහන් අනුකූල නොවීමේ අවස්ථා නිරීක්ෂණය විය.

(අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 01

(i) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති මගින් අවශ්‍ය කෙරෙන හෝ අවසර දී ඇති විටෙක හැර වත්කම් හා වගකීම් එකිනෙකට හිලව් නොකල යුතු වුවත් මණ්ඩලය විසින් බැංකු අයිරා බවට තහවුරු නොකල රු.201,187,108 ක බැර ශේෂය බැංකු ශේෂය සමඟ හිලව්කර මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දක්වා තිබුණි.

(ii) වටිනාකම රු.934,026,234ක් වූ ත්‍යාග සංචිත ගිණුමේ ස්වභාවය හා එහි අරමුණ හෙළිදරව් කළ යුතු වුවත්, මණ්ඩලය විසින් ඒ අනුව කටයුතු කර නොතිබුණි.

**(ආ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 07**

(i) සමාලෝචිත වර්ෂයේදී පාරිතෝෂික ගෙවීම් සඳහා ප්‍රතිපාදනය රු.8,161,089 ක් හා වර්ෂය තුළ ගෙවන ලද පාරිතෝෂික දීමනා රු.807,934 ක් වෙන් වෙන්ව හඳුනාගෙන මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ දැක්වීම වෙනුවට එය හිලව් කර වර්ෂයේ පාරිතෝෂික ප්‍රතිපාදනය රු.7,353,155 ක් ලෙස දක්වා තිබුණි.

(iii) මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සැකසීමේදී කාරක ප්‍රාග්ධන සංචලනයන් ගැළපීමේදී රු.31,748,430ක ජංගම නොවන වගකීම්වල සංචලනයන් ද ගලපා තිබුණි.

**(ඇ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 08**

2001 වර්ෂයේ සිට 2009 වර්ෂය දක්වා ආදායම් බදු නොගෙවීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේදී ඇති වූ හිඟ බදු බැදියාව රු.1,557,163,004 ක් අතීතානුයෝගීව මූල්‍ය ප්‍රකාශනවලට නොගැලපීම හේතුවෙන් පෙර වර්ෂයේදී රු.1,132,035,053 ක්වූ මණ්ඩලයේ හිමිකම සමාලෝචිත වර්ෂයේදී රු.519,726,031 ක ඍණ අගයක් දක්වා අසාමාන්‍ය ලෙස බාදනය වී තිබුණි.

**(ඈ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 19**

ප්‍රමිතිය පරිදි සේවක පාරිතෝෂික පිළිබඳව මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කළ යුතු කරුණු හෙළිදරව් කර නොතිබුණි.

**2.2.2 ගිණුම්කරණ අඩුපාඩු**

ඉකුත් වර්ෂයන්ට අදාල ආදායම් බදු වෙනුවෙන් මණ්ඩලය විසින් දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයා වෙත සමාලෝචිත වර්ෂයේදී ගෙවා තිබුණු රු. 606,195,948 ක් විස්තීර්ණ ආදායම් ප්‍රකාශයට ගැලපීමෙන් තොරව ජනාධිපති අරමුදලට ගෙවිය යුතු දායක මුදලින් අඩුකර දක්වා තිබුණි.

2.3 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 1997 අංක 20 දරන සංවර්ධන ලොතරැයි මණ්ඩල පනත | |
| (i) 18(3) වගන්තිය | අලුතින් පැවැත්වෙන සංවර්ධන ලොතරැයිවල ත්‍යාග ප්‍රදානය කිරීම සඳහා මුදල් ප්‍රමාණවත් නොවන විට පමණක් ත්‍යාග සංචිත ගිණුමේ මුදල් උපයෝජනය කළ හැකි වුවත් ඊට පටහැනිව මණ්ඩලයේ කාර්යාලය පිහිටි ඉඩම හා ගොඩනැගිල්ල අත්පත් කරගැනීම සඳහා ත්‍යාග සංචිත ගිණුමෙන් රු.405,000,000 ක මුදලක් අධ්‍යක්ෂ මණ්ඩල තීරණ පරිදි උපයෝජනය කර තිබුණි. |
| (ii) 19 (1), (2) සහ (3) වගන්ති | පනතේ විධිවිධාන ප්‍රකාර ලොතරැයි සම්බන්ධයෙන් රීති සකස් කර විෂය භාර අමාත්‍යවරයාගේ අනුමැතිය ලබාගෙන ගැසට් පත්‍රයේ පල කිරීමෙන් තොරව ඉකුත් වර්ෂවලදී මෙන්ම සමාලෝචිත වර්ෂයේදීත් ක්ෂණික ලොතරැයි හා දිනුම් ඇදීමෙන් ජයග්‍රාහකයින් තෝරා ගන්නා ලොතරැයි මගින් රු.10,119,457,760 ක අලෙවි ආදායමක් උපයාගෙන තිබුණු අතර ඉන් රු.6,150,951,795 ක් ත්‍යාග සඳහා වෙන් කිරීමත් රු.2,146,551,646 ක් අලෙවි නියෝජිත කොමිස් ලබාදීමත් අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත සිදුකර තිබුණි. |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ **XXIV** වන පරිච්ඡේදයේ 11 වන වගන්තිය හා 2014 දෙසැම්බර් 09 දිනැති අංක එම්එෆ්**2**/**ඩීඑල්බී**/**ජීඊඑන්**/**වීඕඑල්**/**I** දරන මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ ලිපිය | රජයේ දේපල ණය පිළිබඳව විධිවිධානවලට පටහැනිව නිලධාරීන් 14 දෙනෙකු විසින් ලබාගත් එකතුව රු.9,125,000 ක්වූ පෞද්ගලික බැංකු ණය, දේපල ණය ලෙස සලකා මණ්ඩලය විසින් 2014 හා 2015 වර්ෂවලදී පිළිවෙලින් රු.160,527 ක් හා රු.402,772 ක්වූ පොලී බැංකු වෙත ගෙවා තිබුණි. |
| (ඇ) 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය | |
| (i) 9.3.1(අ) මාර්ගෝපදේශය | ඉදිරිපත් කර ඇති මිල ගණන්වල සාධාරණත්වය පිළිබඳව සෑහීමකට පත්වන්නේ නම් පමණක් නිෂ්පාදකයන්ගෙන් හෝ නියෝජිතයන්ගෙන් අළුත්වැඩියා කිරීම සිදුකළ හැකි |

| | | |
|---|---|---|
| | | බව දන්වා ඇතත් , මණ්ඩලයේ වාහන අළුත්වැඩියා කිරීම සඳහා අවස්ථා 07 කදී නියෝජිතයන් ඉදිරිපත් කළ මිල ගණන් පමණක් සලකා රු. 1,321,914 ක අළුත්වැඩියාවන් සිදු කර තිබුණි. |
| | **(ii)**9.3.1(ආ) මාර්ගෝපදේශය | මෝටර් වාහන අළුත්වැඩියා කිරීමේදී රු.**2**00,000 කට වඩා වැඩි අළුත්වැඩියාවන් සඳහා රේඛීය අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ අනුමැතිය ලබාගත යුතු වුවත්, ඊට පටහැනිව අවස්ථා දෙකකදී අළුත්වැඩියා කටයුතු සඳහා රු.853,907 ක් වැයකර තිබුණි. |
| (ඇ) | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය හා 2005 ජනවාරි 31 දිනැති අංක පීඊඩී/28 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය හා 2015 නොවැම්බර් 12 දිනැති අංක පීඊ**/**එල්ඕ**/**ඩීඑල්බී**/**ජීඊඑන්**/2015** දරන රාජ්‍ය ව්‍යාපාර අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ලිපිය | ප්‍රසම්පාදන ක්‍රියාවලියෙන් බැහැරව හා රාජ්‍ය ව්‍යාපාර අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ අනුමැතිය ලබා නොගෙන මාසයකට රු.198,000 ක් බැගින් ගෙවීමට කුලී වාහනයක් ලබාගෙන තිබුණි. |
| (ඉ) | 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 9.7 හා 9.12 වගන්ති | සමාලෝචිත වර්ෂයේදී භාණ්ඩාගාරයේ අනුමැතියකින් තොරව අධ්‍යක්ෂ මණ්ඩලයේ තීරණ මත පමණක් සේවකයන් වෙත රු.12,468,593 ක වෛද්‍යාධාර ගෙවා තිබූ අතර එම වටිනාකම තුළ ගනුදෙනුව තහවුරු කිරීමට අදාල මූලාශ්‍ර ලේඛන නොමැතිව රු.9,713,405 ක් ගෙවා තිබුණි. |
| (ඊ) | 2015 මැයි 25 දිනැති අංක පීඊඩී 1/2015 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය හා 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 8.3.5 වගන්තිය | චක්‍රලේඛ විධිවිධාන වලට පටහැනිව හා අයවැයගත ප්‍රතිපාදන නොතිබියදී මණ්ඩලයේ සහකාර සාමාන්‍යාධිකාරිවරු 06 දෙනෙකු සඳහා නිල වාහන අනුයුක්ත කර රු.969,890ක ඉන්ධන දීමනා ලබාදී තිබූ අතර එම වාහනවල රියදුරු වැටුප් හා අතිකාල වශයෙන් රු.2,664,340 ක් ද ගෙවා තිබුණි. |
| (උ) | 2011 පෙබරවාරි 11 දිනැති අංක පීඊඩී/57 දරන මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශ චක්‍රලේඛයේ 02 ඡේදය | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව මණ්ඩලය ප්‍රචාරණ හා ප්‍රවර්ධන වියදම් සඳහා රු.180,746,018ක වියදමක් දරා තිබුණ ද, ඒ සඳහා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවෙන් අනුමත කළ වාර්ෂික ප්‍රචාරණ වැඩසටහන විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි. |
| (ඌ) | 2003 ජූලි 24 දිනැති අංක 02 දරන ජාතික අයවැය චක්‍රලේඛය | චක්‍රලේඛ විධිවිධාන ඉක්මවා සිලින්ඩර ධාරිතාව 2690 ක් වූ වාහනයක් කුලී පදනම මත ලබාගෙන තිබුණි. |

| | | |
|---|---|---|
| (එ) | 2002 ඔක්තෝබර් 11 දිනැති අංක එම්ඩීපීඅයි/එම්පීආර්ඩී/වීර්එන් දරන ප්‍රතිපත්ති සංවර්ධන හා ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යාංශ චක්‍රලේඛය | කුලී පදනම මත වාහන ලබාගැනීමේදී රියදුරු හා ඉන්ධන, මණ්ඩලය විසින් සපයන අවස්ථාවක රක්ෂණ සේවා කිරීම් හා අලුත්වැඩියාවන් වාහන සැපයුම්කරු විසින් සිදුකළ යුතු වුවත්, එකී විධිවිධාන වලට පටහැනිව එම වියදම මණ්ඩලය විසින් දැරීමට ගිවිසුම් අත්සන් කර තිබුණි. |

**3. මූල්‍ය සමාලෝචනය**

---------------------

**3.1 මූල්‍ය ප්‍රතිඵල**

---------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂය සඳහා මණ්ඩලයේ මූල්‍ය ප්‍රතිඵලය රු. 2,333,259,687 ක අතිරික්තයක් වූ අතර , ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.2,353,246,338 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු.19,986,651 කින් පිරිහී තිබුණි. සමාලෝචිත වර්ෂයේ වියදම රු.491,581,670 කින් අඩු වී තිබුණ ද ආදායම රු.511,568,321 කින් අඩුවී තිබීම මෙම පිරිහීමට හේතු වී තිබුණි.

සමාලෝචිත වර්ෂයේ සහ ඉකුත් වර්ෂ 4 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2011 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා මූල්‍ය ප්‍රතිඵලය අඛණ්ඩ වර්ධනය වී තිබුණද 2014 වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී අතිරික්තය පිරිහී තිබුණි. සේවක පාරිශ්‍රමික, ජංගම නොවන වත්කම් සඳහා ක්ෂය සහ රජයට ගෙවූ බදු සඳහා ගැලපීම් කිරීමෙන් පසු 2011 වර්ෂයේදී රු.2,056,854,697ක්වූ දායකත්වය 2014 වර්ෂය දක්වා අඛණ්ඩව වර්ධනය වී තිබුණු අතර සමාලෝචිත වර්ෂයේදී එය රු.3,853,950,488 ක් විය.

**3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය**

----------------------------------

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂයේ මණ්ඩලයේ ලාභදායිත්ව හා කාරක ප්‍රාග්ධන අනුපාත පිළිබඳ විග්‍රහයක් පහත දැක්වේ.

| | | 2015 | 2014 |
|---|---|---|---|
| | | ------- | ------- |
| (i) | දළ ලාභ අනුපාතය (සියයට) | 43 | 44 |
| (ii) | ශුද්ධ ලාභ අනුපාතය (සියයට) | 19 | 19 |
| (iii) | ජංගම අනුපාතය | 1 **:** 1.6 | 1 **:** 1.5 |
| (iv) | ක්ෂණික අනුපාතය | 1 : **1.**5 | 1 : **1.**5 |

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ ලොතරැයි අලෙවි ආදායම රු.396,817,887 කින් එනම් සියයට 3.2 කින් අඩුවී තිබුණ ද විකුණුම් පිරිවැය රු.124,516,322 කින් එනම් සියයට 1.8 කින් පහළයාම දළලාභ අනුපාතය ඒකාකාරීව පැවතීම කෙරෙහි බලපා තිබුණි.

(ආ) වෙනත් ආදායම් රු.92,519,356 කින් හා නොදිනූ ත්‍යාග ආපසු පවරා ගැනීම් රු.22,231,080 කින් පහළ ගිය ද ලොතරැයි බෙදාහැරීමේ වියදම ද ඊට අනුරූපීව රු.93,853,621 කින් පහළයාම ශුද්ධ ලාභ අනුපාතය ස්ථාවරව පවත්වාගෙන යාමට ඉවහල්වී තිබුණි.

(ඇ) මණ්ඩලයේ ජංගම වත්කම් ඉක්මවා ජංගම වගකීම් පවතින අතර සමාලෝචිත වර්ෂයේදී ද කාරක ප්‍රාග්ධන කළමනාකරණය කෙරෙහි මණ්ඩලයේ අවධානය යොමුකර නොතිබුණි.

**3.3 මණ්ඩලය විසින් ආරම්භ කර ඇති නෛතික සිද්ධි**

ආයතනය විසින් බාහිර පුද්ගලයකුගෙන් අයවිය යුතු රු.2,520,000 ක් අයකර ගැනීම සඳහා නඩුවක් පවරා තිබුණද 2015 දෙසැම්බර් 31 දින වනවිට එහි අධිකරණ ක්‍රියාමාර්ග නිම වී නොතිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්යසාධනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 1997 අංක 20 දරන සංවර්ධන ලොතරැයි මණ්ඩල පනතේ 11 වගන්තිය ප්‍රකාරව මණ්ඩලයේ අරමුණු පහත පරිදි වේ.

(i) ජනාධිපති අරමුදලට අරමුදල් උත්පාදනය කිරීමේ කාර්යය සඳහා ලොතරැයි පැවැත්වීම හෝ ඒ සඳහා කටයුතු කිරීම.

(ii) එසේ ලැබෙන අරමුදල් ජනාධිපති අරමුදලට ප්‍රේෂණය කිරීම.

ඉහත අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා සමාලෝචිත වර්ෂයේදී ලොතරැයිපත් 8 ක් පවත්වා රු.මිලියන 1,727 ක් උපයා ඉන් රු.මිලියන 1,628 ක් ජනාධිපති අරමුදල වෙත ප්‍රේෂණය කර තිබුණි.

(ආ) ලොතරැයිපත් අලෙවිය හා ප්‍රචාරණ පිරිවැය සැසඳීම

| ලොතරැයියේ නම | විකුණුම් ආදායම | | | | ප්‍රචාරණ පිරිවැය | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | 2014 | 2015 | විචලනය | ප්‍රතිශතය | 2014 | 2015 | විචලනය | ප්‍රතිශතය |
| | රු. | රු. | රු. | % | රු. | රු. | රු. | % |
| ශනිදා වාසනාව | 2,007,008,025 | 2,096,216,100 | 89,208,075 | 4.44 | 7,791,985 | 26,927,823 | 19,135,838 | 245.58 |
| සංවර්ධන / ලග්න වාසනාව | 2,492,645,100 | 2,424,568,575 | (68,076,525) | (2.73) | 27,736,856 | 30,233,422 | 2,496,566 | 9.00 |
| ජයෝදා | 1,255,317,525 | 1,174,951,800 | (80,365,725) | (6.40) | 26,562,805 | 24,484,608 | (2.078,197) | (7.82) |
| ජනජය / ගැලැක්සි ස්ටාර් | 854,071,350 | 906,953,850 | 52,882,500 | 6.19 | 10,795,645 | 27,748,445 | (16,952,800) | 157.03 |
| නියත ජය | 1,025,266,275 | 970,588,575 | (54,677,700) | (5.33) | 24,502,245 | 26,113.147 | 1,610,902 | 6.57 |
| සුපර් බෝල් | 2,314,937,625 | 2,082,186,975 | (232,750,650) | (10.05) | 39,286,399 | 30,310,818 | (8,975,581) | (22.85) |

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) ශනිදා වාසනා හා ජනජය / ගැලැක්ස් ස්ටාර් යන ලොතරැයි පත්වල ප්‍රචාරණ පිරිවැය ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ දී පිළිවෙලින් සියයට 246 කින් හා සියයට 157 කින් වැඩිවීමට සාපේක්ෂව විකුණුම් ආදායම වර්ධනය වී තිබුණේ සියයට 4 ක හා සියයට 6 ක අඩු ප්‍රතිශතයකිනි.

(ii) නියත ජය ලොතරැයියේ ප්‍රචාරණ පිරිවැය ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ සියයට 6.57 කින් වැඩි වුවද, විකුණුම් ආදායම සියයට 5.33 ක පිරිහීමක් නිරීක්ෂණය විය.

(iii) සුපර් බෝල් ලොතරැයියේ විකුණුම් ආදායම පසුගිය වර්ෂයට සාපේක්ෂව සියයට 10.05 ක පිරිහීමක් නිරීක්ෂණය විය.

(iv) සංවර්ධන/ ලග්න වාසනා ලොතරැයියේ ප්‍රචාරණ පිරිවැය පසුගිය වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ සියයට 9 කින් වැඩි වුව ද , විකුණුම් ආදායම සියයට 2.73 ක පිරිහීමක් නිරීක්ෂණය විය.

## 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

--------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ඉකුත් වර්ෂවලදී බදු ගෙවීම පැහැර හැර තිබීම නිසා ඇති වූ හිඟ බදු මුදල් පියවීම වෙනුවෙන් සමාලෝචිත වර්ෂය තුළදී රු.131,270,475 ක් වූ ස්ථාවර තැන්පත් ආයෝජන අවලංගු කර මුදල් ආපසු ලබාගැනීම නිසා ලැබිය යුතුව තිබූ පොලී ආදායම රු.4,815,246 ක් මණ්ඩලයට අහිමි වී තිබුණි.

(ආ) අලෙවි ප්‍රවර්ධනය සඳහා ණය පදනම මත ටිකට් පත් නිකුත් කිරීමේදී මිලදී ගනු ලබන ටිකට් පත් 25 කට එකක් බැගින් නොමිලේ ලබාදීමට තීරණය කර තිබුණු අතර ටිකට් පත් දෙකක් සඳහා දිනුම් වාර 13 කට අදාලව මෙම ප්‍රවර්ධන වැඩපිළිවෙල ක්‍රියාත්මක කිරීමට පෙර තත්ත්වය හා වැඩපිළිවෙල ක්‍රියාත්මක කිරීමෙන් පසු තත්ත්වය සමඟ සැසඳීමේදී ටිකට් පොත් 42,227 ක අලෙවිය අඩුවීමක් සිදු වී තිබුණි. ඒ අනුව නොමිලේ නිකුත්කළ ටිකට් පොත් 130 ක වටිනාකම වූ රු.107,250 ක් ඵල රහිත වියදමක් ද යන්න විගණනයේදී බැහැර කළ නොහැක.

(ඇ) ලොතරැයි දිනුම් ඇදීමේ තොරතුරු පද්ධතියක් ස්ථාපිත කිරීම සඳහා ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කිරීමෙන් තොරව 2009 වර්ෂයේදී සැපයුම්කරුවෙකු තෝරාගෙන 2014 අගෝස්තු 31 දින දක්වා සේවා ගිවිසුමට එළඹ තිබුණු නමුත් එදින සිට 2016 අගෝස්තු 31 දක්වා දින දීර්ඝ කිරීම් දෙකක් ලබා දී අදාළ සමාගමට රු.81,997,776 ක් ගෙවීම් කර තිබුණ ද 2016 ජූලි 13 දින වනවිටත් තොරතුරු පද්ධතිය ස්ථාපිත කර නොතිබුණි.

## 4.3 මෙහෙයුම් ක්‍රියාකාරකම්

------------------------------

මණ්ඩලය විසින් සතිපතා දිනුම් අදිනු ලබන වටිනාකම රු.862,918,650 ක් වූ ලොතරැයිපත් 52,298,100 ක් 2015 අප්‍රේල් 01 දින සිට 2016 මාර්තු 31 දක්වා කාලපරිච්ඡේදය තුළ ඇපයක් / සුරක්ෂණයක් ලබාගැනීමකින් තොරව ණය පදනම මත අලෙවි කර තිබුණි.

## 4.4 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

--------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ග්ලැක්සි ස්ටාර් ලොතරැයිපත් අලෙවි ප්‍රවර්ධනය සඳහා ග්ලැක්සි ස්ටාර් ලාංඡනය සහිත කුඩ 700 ක් බෙදාහැරීම වෙනුවෙන් රු.308,000 ක් වැය කර තිබුණ ද කුඩ සැපයුම්කරුගේ වෙළඳ ලාංඡනය සහිත කුඩ බෙදා හැර තිබූ බැවින් එම ගනුදෙනුව තුළින් මණ්ඩලයේ අපේක්ෂිත අරමුණ ඉටු වී නොතිබුණි.

(ආ) 2008 අප්‍රේල් 22 දින මණ්ඩලය නමින් ලියාපදිංචි කර තිබුණ රු.8,095,000 ක් වටිනා ඩබල්කැබ් රථය එවකට සිටි සභාපතිවරයා විසින් සැපයුම්කාර සමාගමෙන් භාර ගෙන තිබුණ බව අනාවරණය විය. නමුත් එම රථය සමාලෝචිත වර්ෂයේ අවසාන දිනය වන විට ද මණ්ඩලය වෙත භාර දී නොතිබුණ අතර විගණනයේදී එහි භෞතික පැවැත්ම තහවුරු කිරීමට

ආයතනය අපොහොසත් විය. කෙසේ වුව ද  මෙම මෝටර් රථය මණ්ඩලයේ වත්කමක් ලෙස සලකා ගිණුම්ගතකර තිබූ අතර එයට අදාල වගකීම වෙළඳ හා අනෙකුත් ගෙවිය යුතු දෑ යටතේ  බැරකමක් ලෙස දක්වා තිබුණි.

## 4.5 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

මණ්ඩලය විසින් 2010 වර්ෂයේදී රු.38,752,448 ක් වැය කර ලොතරැයි දිනුම් ඇදීම් රූගත කිරීම සඳහා චිත්‍රාගාරයක් ඉදිකර තිබුණද  අදාළ කාර්යය සඳහා එම චිත්‍රාගාරය භාවිතා කර නොතිබුණ අතර චිත්‍රාගාරයේ පවතින අඩුපාඩු සම්බන්ධයෙන් අධ්‍යයනය කර රූපවාහිනී සංස්ථාව මගින් 2012 ජූනි මාසයේදී ලබාදී ඇති නිර්දේශ ක්‍රියාත්මක කිරීමටද මණ්ඩලය කටයුතුකර නොතිබුණි. ඒ අනුව, මණ්ඩලය සතු චිත්‍රාගාරය භාවිතා නොකර ලොතරැයි දිනුම් ඇදීම ජාතික රූපවාහිනී සංස්ථාව මගින් ඉටුකිරීම වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී රු.36,850,000 ක් ජාතික රූපවාහිනී සංස්ථාව වෙත ගෙවා තිබුණු අතර මණ්ඩලයේ චිත්‍රාගාරය මණ්ඩලයේ දේශන ශාලාවක් ලෙස  භාවිතා කර තිබුණි.

## 4.6 හඳුනාගන්නා ලද පාඩු

විධිමත් පරිදි ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර ප්‍රසම්පාදන කටයුතු ක්‍රියාත්මක නොකිරීම හා, නියමිත කාලපරිච්ඡේදය තුළදී ලොතරැයිපත් මුද්‍රණය සඳහා ගිවිසුම් වලට එළඹ නොතිබීම  හේතුවෙන් මුද්‍රණ කටයුතුවලින් මණ්ඩලයට රු.6,093,297 ක  අලාභයක් සිදුවී තිබුණි.

## 4.7 ආර්ථික නොවූ ගනුදෙනු

ඒකාබද්ධ තොරතුරු පද්ධතියක් ඇති කිරීම සඳහා සමාලෝචිත වර්ෂය තුළදී එකතුව රු.3,472,393 ක් වැයකර තිබුණ ද , පසුව එම කාර්යය අවලංගු කර තිබූ බැවින් මෙම වියදම නිශ්ඵල වියදමක් බවට පත්ව තිබුණි.

## 4.8 කාර්ය මණ්ඩල පරිපාලනය

අනුමත කාර්ය මණ්ඩලය 221 ක් වුවද, තථ්‍ය කාර්ය මණ්ඩලය 238ක් විය. 2015 දෙසැම්බර් 31 දිනට මණ්ඩලයේ අනුමත කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු 19 ක් පැවති අතර අතිරික්ත සංඛ්‍යාව 36 ක් විය.

# 5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

## 5.1 සංයුක්ත සැලැස්ම

අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත කළ කාර්යසාධන  වාර්තා හෝ ප්‍රගති වාර්තා විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණු බැවින් 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ  5 වගන්තිය ප්‍රකාරව සංයුක්ත සැලැස්මේ සඳහන් ඉලක්ක වලට මණ්ඩලය ළඟා වී ඇති බැව් තහවුරු කර ගැනීමට නොහැකි විය.

## 5.2 ප්‍රසම්පාදන සැලැස්ම

සමාලෝචිත වර්ෂය සඳහා විධිමත් ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

## 5.3 අයවැය ලේඛනමය පාලනය

සමාලෝචිත වර්ෂයේදී අයවැයගත ආදායම් හා වියදම් තථ්‍ය ආදායම් හා වියදම් සමඟ සැසඳීමේදී සියයට 10 සිට සියයට 94 දක්වා පරාසයක විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී මූල්‍ය පාලන කාරකයක් ලෙස උපයෝගී කරගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

## 5.4 පාරිසරික හා සමාජ වගකීම් ඉටුකිරීම.

සංවර්ධන ලොතරැයි ත්‍යාග ලාභීන්ගෙන් සෑම වර්ෂයකම ත්‍යාග වටිනාකමෙන් සියයට 4 කට ආසන්න ප්‍රමාණයක් සඳහා හිමිකම් පෑමට ඉදිරිපත් නොවන බවත් ඉකුත් වර්ෂ 5 තුළදී එසේ හිමිකම් නොපෑ වටිනාකම රු.1,103,636,625 ක් නිරීක්ෂණය විය. සමාලෝචිත වර්ෂයේ මාස 07 ක් තුළ හිමිකම් නොපෑ ලොතරැයිපත් අතුරින් රු.50,000 සිට රු. 1,000,000 දක්වා වූ ලොතරැයි 49 ක් විය. ජයග්‍රාහකයන් වෙත අදාළ ජයග්‍රහණයන් ලබා දීමෙන් මහජන විශ්වාසය ගොඩනැගීමත් මණ්ඩලයේ කීර්තිනාමය ඉහළ තත්ත්වයකට ගෙන ඒමටත් හැකිවන බැවින් ත්‍යාග සඳහා හිමිකම් නොපෑම් අවම කිරීම සඳහා කිසිදු වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් මණ්ඩලයේ අවධානය යොමු වී නොතිබුණි.

## 6. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු මණ්ඩලයේ සභාපතිවරයාගේ අවධානයට වරින්වර යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කළයුතු වේ.

| | පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|---|
| (අ) | ගිණුම්කරණය | මණ්ඩලයේ බදු, ගෙවිය යුතු ත්‍යාග අවසන් ගිණුම්වල හඳුනානොගැනීම හා හෙළිදරව් නොකිරීම සහ පරිගණකගත ගිණුම්කරණ පද්ධතියක් පවත්වා නොගැනීම. |
| (ආ) | කාර්ය මණ්ඩල පරිපාලනය | අනුමත සේවක සංඛ්‍යාවට අමතරව සැලකිය යුතු සේවක මණ්ඩලයක් කොන්ත්‍රාත් පදනම මත සේවයේ යොදවාගෙන තිබීම. |
| (ඇ) | වත්කම් කළමනාකරණය | මණ්ඩලයේ චිත්‍රාගාරය සම්බන්ධයෙන් හානිකරණ පරීක්ෂණයක් සිදු කිරීමේ වැඩ පිළිවෙලක් සකස් වී නොතිබීම. |
| (ඇ) | ගබඩා පාලනය | ගබඩා ලේඛන නිසි පරිදි නඩත්තු නොකිරීම. |